# ග්‍රැමෆෝන් යුගයේ හෙළි නොවූ තොරතුරු



මහාචාර්ය
සුනිල් ආරියරත්න

ක්‍රි.ව 1913 දී චාල්ස් ඩයස්ගේ ඉල්ලීම පරිදි ආනන්ද රාජකරුණා ග්‍රැමෆෝන් තැටි සඳහා ගීත රචනා කළ බවත් ඒ ගීත අතරින් සොලොස්මස්ථානය වැඳිය යුතු පිළිවෙළ පැවසෙන 'සිරි ඝන මුනිවර' නමැති ගීතය සහ අතීත ශ්‍රී විභූතිය පැවසෙන 'පෙර කලෙහි ලොවේ' නමැති ගීතය ඉතා ජනප්‍රිය වී තිබෙනවා.



ග්‍රැමෆෝන් ගී තැටිගත කිරීම ක්‍රි.ව 1905න් හෝ 1906න් ආරම්භ කළත් ග්‍රැමෆෝන් ගීත සාහිත්‍යය ඇරඹෙන්නේ ක්‍රි.ව 1917 දී පමණ සිටයි. අවුරුදු 12ක් පමණ සමාසන්න කාලයක් තැටියට නැඟුණේ නූර්ති ගී යි. ඒ නිසා ඒ ගීත අයත් විය යුත්තේ නූර්ති ගී සාහිත්‍යයටයි.

විවිධ නිර්මාණ ක්ෂේත්‍රයන් ඇසුරු කරන සාහිත්‍යකාරයන් අතරින් ගීතයට වඩාත් ඥාතීත්වය පාන තැනැත්තා කවියායි. ඒ නිසා ග්‍රැමෆෝන් ගීත සාහිත්‍යයේ වර්ධනය සිදුවීමට එවකට සිටි කවීන් විශාල වෙහෙයක් කරන්නට ඇති. නාඩගම්, නූර්ති කාලවල දී එම නාට්‍යවල පිටපත් රචකයන් ම ගීත රචනා කළා. ඒ කාලයේ සිටි කවීන් නාඩගම් හා නූර්තිවලට ගීත රචනා කිරීමට එතරම් දායකත්වයක් ලබා දුන්නේ නැහැ.

පියදාස සිරිසේන, ජී.එච් පෙරේරා, එස්.මහින්ද හිමි, ආනන්ද රාජකරුණා, කුමාරතුංග මුනිදාස, රැයිපියෙල් තෙන්නකෝන් යන කවීන් ග්‍රැමෆෝන් ගී යුගයේ ප්‍රථම භාගය සඳහා ගීත රචනා කළා. ග්‍රැමෆෝන් ගී යුගයේ පශ්චිම යාමය තුළ මීමන ප්‍රේමතිලක, පී.ඩී අල්විස් පෙරේරා, විමලරත්න කුමාරගම, සාගර පළන්සූරිය යන කවීන් කාව්‍යකරණයේ නිරත වී සිටියා. මේ සියලු ම කවීන්ගේ සඳ් අසඳ් කාව්‍ය සියල්ලෝ ම එක් පොදු ලක්ෂණයක් තිබුණා. එනම් ඒවා සුගේය රචනා වීමයි. ගායනයට උචිත අයුරින් මේ නිර්මාණ සැකසුණත් සංගීත ශිල්පීන් එම රචනා ගීත සේ හැඳින්වීමට එතරම් කැමැත්තක් දක්වූයේ නැහැ. ගීතය සිය දායකත්වය ලැබීමට තරම් වන කලා මාධ්‍යයක් ලෙස පිළිගැනීමට ද මේ කවියන් එතරම් කැමැත්තක් දක්වූයේ නැහැ.

ඒත් පූර්වෝක්ත කවීන් ගීතය හා සම්බන්ධ වුණු අවස්ථා කිහිපයක් ම දකගන්නට ලැබුණා. ක්‍රි.ව 1913 දී චාල්ස් ඩයස්ගේ ඉල්ලීම පරිදි ආනන්ද රාජකරුණා ග්‍රැමෆෝන් තැටි සඳහා ගීත රචනා කළ බවත් ඒ ගීත අතරින් සොලොස්මස්ථානය වැඳිය යුතු පිළිවෙළ පැවසෙන 'සිරි ඝන මුනිවර' නමැති ගීතය සහ අතීත ශ්‍රී විභූතිය පැවසෙන 'පෙර කලෙහි ලොවේ' නමැති ගීතය ඉතා ජනප්‍රිය වී තිබෙනවා. ආනන්ද රාජකරුණා බයිලා පොතක් ලියා තිබෙනවා. එස්.මහින්ද හිමියන් විවිධ අවස්ථාවල දී ගායනා කිරීම සඳහා ගීත කිහිපයක් ම රචනා කර තිබෙනවා. එසේ රචනා කළ ගී අතර කොම්පඤ්ඤවීදියේ ශ්‍රී සෞගතොදය රිවිදින ධර්ම පාඨශාලීය ගීතිකාවක් වන 'ජාතික දියුණුව නෑ සිදු වනනේ ආගමනයෙන් තොර වී තොර වී' කොම්පඤ්ඤ වීදියේ ඩී.ඇම් කන්නන්ගර සංගීතඥයාගේ අයදුම පරිදි සාදා දෙන ලද 'ශ්‍රී සුරදෙව් පුර ඒ අය දුන් ලෙද, වෛශාඛ ප්‍රීති ගීතිකාවක් වන 'ගසක් නොහැර සුපිපුණු මල් සුවඳ අසා ගනඳුර' කොළඹ අලුත් කඩේ බෞද්ධ සහෝදර සමිතියෙහි ශ්‍රී සර්ධර්මෝදය ධර්ම පාඨශාලා භාවිතය සඳහා සදා දෙන ලද 'උත්තර සිංහල ජාතිකයන් පෙර', රයිගම්පුර සරසවි මුළුවේ අයදුම් පරිදි ලියන ලද රයිගම්පුර ජාතික ගීය වූ 'පිබිදෙනු රයිගම් මවගේ දරුවනි ජාතිකානුරාග විදා පා' ආදිය වෙයි. 'පනාමුරේ ඇත් රාජා' නමැති ගීතය ලියන ලද්දේ ජී.එච් පෙරේරා කිවිඳුන් විසින් යයි සමහරු පවසනවා.

හෙළහවුල් සමුළුවේ දී කුමාරතුංගයන්ගේ සහ රැයිපියෙල් තෙන්නකෝන්ගේ ඇතැම් රචනා ගීත විදියට ගායනා කළා. පානදුරේ මාලමුල්ලේ සිරිසේන මලලසේකර හා කුමාරතුංගයන් විසින් 'සැරදේ වවුලු රජින්දේ' පැදි පෙළ ගායනා කිරීම, සිරිසේන මලලසේකර විසින් 'දුදනො' ද බිඳ බඳ ලද තෙද කඳ' හෙවත් කුකුළු හැවිල්ල ගායනා කිරීම, ඇම්.ජී පෙරේරා විසින් තනුව සකස් කරන ලද 'සුකොමල අතුරින් බඳ ලොල මිහිරින්' නමැති පැදි පෙළ පානදුරෙ මහානාම විද්‍යාලයීය ශිෂ්‍යයන් විසින් ගයනු ලැබීම එවැනි අවස්ථා කිහිපයක්.

ග්‍රැමෆෝන් ගී යුගයට සමාන්තරව මෙවැනි සුළු සිද්ධීන් කිහිපයක් වාර්තා වුව ද කවීන් ද, ග්‍රැමෆෝන් ගීත රචකයන් ද රේල් පීලි දෙකක් සේ අන්‍යොන්‍ය හමුවකින් තොරව ම ගමන් ගත්තා. ගීතයේ පද පෙළ, තනුව, ගායන ශිල්පියා හඳුනා ගැනීමට විනා ඒ පද පෙළ කළ පුද්ගලයා හා සංගීත සම්පාදකවරයා හඳුනා ගැනීමට ග්‍රැමෆෝන් ගී යුගය අපට අවකාස සලසලා නැහැ. ග්‍රැමෆෝන් ගී යුගයේ ප්‍රථම වසර තිහ හෝ තිස් පහ තුළ නිකුත් වූ තැටිවල පද රචකයාගේ හෝ සංගීත රචකයාගේ නම සඳහන් වන්නේ ඉතාමත් කලාතුරකින්. මේ නිසා ග්‍රැමෆෝන් ගීත සාහිත්‍යය විමසන කල විධිමත් ගීත රචක නාම ලේඛනයක් පිළියෙළ කරගන්ට ලැබෙන්නේ නැහැ. ගීතවල කර්තෘත්වය සොයා ගන්නටත් අපහසු වෙනවා. ආනන්ද සමරකෝන්ගේ ගීත සියල්ල ඔහු විසින් රචනා කර ඇති බැවින් කර්තෘත්වය පිළිබඳ ගැටලුවක් පැන නොනඟින්නේ ඔහුගේ ගීත සම්බන්ධයෙන් පමණයි.

ග්‍රැමෆෝන් තැටියේ ප්‍රාරම්භක රචකයන් නූර්ති ශිල්පීන් ම වූ බව ඉතා පැහැදිළියි. සී දොන් බස්තියන්, ජෝන් ද සිල්වා, ආර්, ජෝන් පෙරේරා, ඇල්.පී සිල්වා, චාල්ස් ඩයස්, පී.ටී.පී ප්‍රේමචන්ද්‍ර, බී.එල් බෝධිපාල ආදීන්ගේ ප්‍රබන්ධ ග්‍රැමෆෝන් තැටියේ ප්‍රාරම්භක අවධිය නියෝජනය කර තිබෙනවා. ඉන් පසු ක්‍රි.ව 1917 - ක්‍රි.ව 1939 අතර කාලය තුළ ග්‍රැමෆෝන් ගීත කර්තෘවරුන් අවිනිශ්තිතයි. පහත දක්වා ඇත්තේ එවැනි අවිනිශ්චිත කර්තෘක ගීතවලින් කිහිපයක්.

පර්ලෆෝන්:- 1930 - 'දූ ගැන දුකයි', 'ඉදින් මා දෝණියේ නාඩා',(ලක්ෂ්මී බායි සහ පර්ල් දසනායක), 'ප්‍රිය රාම ස්වාමි'(ඈනී බොතේජු), 'රම්‍ය මගේ මාතා', 'චරිතේ සුද්ද පුතා', 'ධීර වූ මහ සයුර', 'අප ලංකා වාසී බෝ'(රොම්ලස් ද සිල්වා), 'හිරු සඳ සේ', 'මේ ලෝ වාසි දන්නේ නම්'(පී.ඩී.එස් සිරිවර්ධණ), 'ශ්‍රීධර පාදම්බුජ', 'නිත්‍ය පරම සුබ'(ඩී.ඩී වීරක්කොඩි).

ඕඩියන්:- 1931 'මා සිරුරෙහි', 'ලංකාරාමේ වසන්තේ',(ඈනී බොතේජු), 'නිකම්ම කාලේ යන්නා'(කේ.රොබට් පෙරේරා සහ විල්බට් ඇන්තනී), 'ආචාර්ය භක්තිය'(ඩබ්.සිල්වෙස්ටර්), 'සාප කරති ලක මහ දන'(රොම්ලස් ද සිල්වා)

බ්‍රෝඩ්කාස්ට්:- 1935 -'ගොතිරේ උත්තර', 'විචාර අලෙනි', 'මහා මුනි', 'දීපේ ලංකා'(ලක්ෂ්මී බායි), 'ශරිරෙ රන් සළු', 'දීපේ මේ අපගේ','හීන දීන', 'කර්මේ විපාක'(රෙජිනා ප්‍රේරා), 'රත්නේ දිලෙයි', 'නිසා මා සුන්දර', (සුසිලා ජයසිංහ), 'දේශ දේශාදී', 'සැම සම්පත්', 'එපා බොන්ට මත්පැන්', 'සැපා නෑ මේ ලොවේ'(ජෝසප් ප්‍රේරා), 'සිංහ වෙස් ගෙන'(ක්ලෙමන්ට් රුද්‍රිගෝ), 'ශ්‍රී ලංකා දීපේ', 'දිස්නෙ දෙනා'(විල්බට් ඇන්තනී), 'පෙර දිගින්', 'වීර්යවන්ත'(ලෝරන්ස් ප්‍රේරා)

1939න් පසු ගී ගියූ අය අතර ආනන්ද සමරකෝන්, යූ.ඩී පෙරේරා, එබ්.ඩී මර්සිලීනු, ඇල්බට්, සී.වීරසේකර, බෙලිඅත්තේ වෛද්‍යාචාර්ය, එම්.ඩබ්.එන්.එස් විජයසිරි, බී.ඇල්.බෙර්ධිපාල, වින්සන්ට් සෝමපාල, සිරිසේන විමලවීර වැනි අය පුරෝගාමී වුණා. ආටිගල සරත්චන්ද්‍ර, හර්බට් ඇම්. සෙනෙවිරත්න, ආර්.එන්.එච් පෙරේරා, පියසේන කොස්තා, මර්සලීන් ජයකොඩි, එබ්.ඩී ඇල්බට් පෙරේරා(අමරදේව), ආනන්ද සරත් විමලවීර, කරුණාරත්න අබේසේකර, එන්.කේ කාරියවසම්, සිරිදේව, ඩබ්.ජයවර්ධන, ආනන්ද කවිරත්න, හර්බි සෙනෙවිරත්න, ආතර් ද සිල්වා, ධර්මදාස ඩයස්, සුසිල් ප්‍රේමරත්න, ඒ.ජේ ද සොයිසා, ධර්මපාල ජයවීර, ආනන්ද සිරිසේන, ජීඑම්.කේ කරුණාදාස, පී.එස්.ප්‍රනාන්දු, හෙන්රි ධර්මසේන, ධර්ම ශ්‍රී ජේ දහනායක, වැල්ලබඩ විමල් ද එස්. අභයසුන්දර, (විමල් අභයසුන්දර), ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, වයි.එච් සෝමපාල, ඇල්.එම්.ඩී ද සිල්වා, ඇස්. කැකුලාවල යන අය ද පසුකාලීනව ග්‍රැමෆෝන් තැටි සඳහා ගීත සම්පාදනය කළ අයයි.

ග්‍රැමෆෝන් ගී යුගයේ මුල් අවධියේ ප්‍රථම ස්ථානය ලැබුණේ ගීතියේ තනුවටයි. ද්විතීය ස්ථානය ගීතයේ සාහිත්‍යයට ලැබුණු අතර ගීත ගායනයට ලැබුණේ තෘතීය ස්ථානයයි. පළමුවෙන් තනුව තෝරා ගන්නා අතර එය ඉතා තීක්ෂණ කටයුත්තක් වුණා. ගීතයේ ජනප්‍රියත්වයට තනුව ප්‍රබල සාධකයක් වූ නිසා ම මේ කටයුත්ත සිදු කෙරුණේ දැඩි අවධානයකුත් සමඟයි. ශ්‍රාවකයාගේ මනෝරංජනය පිණිස හේතුභූත වන සාහිත්‍යයෙන් පරිපෝෂණය කරන්නට දෙවනු වගබලා ගත්තා. ගායන ශිල්පියකු තෝරා ගත්තේ ඉන් අනතුරුවයි. ග්‍රැමෆෝන් ගායනය සඳහා නාට්‍ය වේදිකාවේ ප්‍රවීන ශිල්පීන් දායක වුවත් ග්‍රැමෆෝන් තැටිය ජනප්‍රිය කරන ලද්දේ නවක ගායක ගායිකාවන් විසිනුයි. රුක්මනී දේවි, ඇම්.කේ වින්සන්ට්, කේ.කේ රාජාලක්ෂ්මී, ග්රේටා ජෙනට් ද සිල්වා, ස්ටැන්ලි මල්ලවආරච්චි, ඒ.ආර්.ඇම් ඉබ්‍රාහිම්, ලතා, මොහිදීන් බෙග්, ඒ.ඇම්.යු රාජ් යන ශිල්පීන්ගේ දක්ෂතා ග්‍රැමෆෝන් ගීය උත්කර්ෂවත් වීමට බෙහෙවින් බලපෑවා. ඒ වගේ ම ග්‍රැමෆෝන් තැටිය නිසා මෙම ශිල්පි ශිල්පිනියන් බෙහෙවින් ජනප්‍රිය වෙන්න පටන් ගත්තා. ග්‍රැමෆෝන් ගීතවල දී ගායන ශිල්පියා තෘතීය ස්ථානයට පත් වුණු බව කිව්වේ ඒ නිසයි.

තැටි නිෂ්පාදකයන් ගීතවල අන්තර්ගතය ගැන බෙහෙවින් සැලකිලිමත් වුණා. ගීතයක තනුව වගේ ම ගීතයකින් ගම්‍යමාන වන අර්ථය ශ්‍රාවකයන්ට දිනා ගැනීමේ මා හැඟි අත්වැලක් බව ඔහුගේ විශ්වාසයයි. ලුහුඬින් තැටිවල අඩංගු කාරණා, ගීතයේ අදහස පෙරටුකොට දක්වමින් නිෂ්පාදකයින් විසින් තැටි ප්‍රචාරය කර හැරියා, පහත සඳහන් ඕඩියන් වෙළෙඳ දැන්වීමේ දක්නට ලැබෙන්නේ ගායන

24 වන පිටට